# හිනා මාමා




රශිනි විමර්ශා රත්නායක

# හීනා මාමා

## කතා

රශිනි විමර්ශා රත්නායක

5 ශ්‍රේණිය E

**ISBN 978-624-211-392-0**

කෘතිය පළ කරන දිනය – 2026.05.10

# පිදුම

මේ පොත කියවන ඔයාට ..
ඔව් ඔව් ..
ඔයාට තමයි ...



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත් කරණ ව්‍යාපෘතිය නම්කළ හැකි ය.

දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාර ධර්ම මෙන්ම නිර්මානාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි.

එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩකර වූ හේම මාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

***ශෂිකලා සේනාධීර***

**විදුහල්පති**

**මහාමායා බාලිකා විද්‍යාලය**

**මහනුවර**

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි.මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය ,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

මුළු ජීවිතයම විනෝදයෙන් ගෙවූ එක්තරා වයස්ගත පුද්ගලයෙක් අපේ ගෙදරට ඒමට පුරුදුව සිටියා.

ඔහුට ගමේ සාමාන්‍ය මිනිස්සුන් කිව්වේ හිනා මාමා, හිනාකාරයා වගේ එක එක නම් වලින්.

කවුරු කොහොම කතා කළත් එයාට ඒකෙන් වැඩක් වුණේ නැහැ. ඔහු හරිම විනෝදයෙන් ජීවත් වුණා.

ඔහුගේ බිරිඳ මියපරලොව ගියාට පස්සේ තනිවම සිටින ඔහුට යම්කිසි මුදලක් ලැබුණේ අපේ ගෙදර වැඩ කරලායි.

වැඩ අවසන් වී නාගෙන ගෙදර යන ඔහු සවස් කාලයේ මටත්, නංගිටත් කතන්දර කීමට අපේ ගෙදර පැමිණෙයි.

මම සුනිල්. මගේ නංගි මනුති. මල්ලි මනුක.

ඔහු අපට කතා කීමට පෙර බුලත් විටක් රැගෙන හපයි.

"ඔන්න පුතේ, මම අද කියන්නේ...." කියා පටන් ගත්තාට කතාවේ කොටස් කියනවා, මැදින් පැනලා තව දේවල් කියනවා.

අපි ඒකට කියන්නේ පිළි පනිනවා කියලායි.

සත්තු වත්තෙන් පටන් ගත්තොත් කතාව ඔහු ඉවර කරන්නේ තමාගේ ඇඳුමෙන් හෝ දරු දැරියන්ගෙනුයි.

අද නම් කතාව සත්තු වත්තක් ගැනයි. " ඔන්න පුතේ, අද මං කියන්නේ මං ගියපු දෙහිවල සත්තු වත්ත ගැනයි. පුතේ, දෙහි කන්න කැමතිද?"

"අයියෝ.... සීයේ, කතාව පටන් ගන්නකෝ...." නංගියි, මමයි කෙදිරි ගෑවා.

"හරි හරි පුතේ. ඉන්නකෝ මම මුලින්ම ගියේ සතුන්ගේ රෝහලටයි. ඊට පස්සේ මම දැක්කා හපුළුවෝ දෙන්නෙක් ලෙඩ හොඳ වෙලා එනවා"

"ඈ... ඒ මොක්කුද?"


"ඇයි පුතේ, උණහපුළුවන්ට උණ නිසා ඉස්පිරිතාලේ ගිහිල්ලා හොඳ වෙලා එනවා. උන් එතකොට හපුළුවොනේ"

"හෑ!"

"ආ... ආයේ බූරුවෙකුත් හිටියා. හැබැයි අසනීපෙකට නම් නෙමෙයි."

"එහෙනම් මොකටද?" නංගි ඇහුවා.

“උන් ඇවිත් ඉන්නේ හිතේ අමාරුවට. මොකද කිව්වොත් මෝඩ මිනිස්සුන්ට හැමෝම බූරුවා කියන නිසයි. පව් නේද?”



“මං දැක්කා ඊට පස්සේ වතුර බොන තැනක්. හැබැයි ඒකෙ බොන්න ඕනේ නම් ඒකට බහින්න ඕනි. ඊට පස්සේ මං සරමත් පිටපොටේ ගහගෙන ඒකට බැස්සා. මෙන්න මුරකාරයෙක් ඇවිත් මට බැන්නා.”

“ඉතින් මං එතනින් බැහැලා යද්දී මම දැක්කා චිපාසි කියල බෝඩ් එකක් තියෙනවා. මගේ යාලුවාත් චිපාසි. එයාව අපි අන්තිමට දැක්කේ අපි පොඩි කාලේ තිබ්බ නාට්‍යයක. එදා එතන ගින්නක් ඇතිවුණා.”

“එතනින් පස්සේ අරයා අතුරුදහන්. මේ එයාද දන්නෑ. නෑ නෑ නෑ මේ වෙන මොකෙද්දෝ. මේ කවුද මේ කියලා මුරකාරයාගෙන් ඇහුවාම කියනවා චිම්පන්සියාලු.”

“ඔහොම බලාගෙන යද්දි ලොකුම ලොකු කූඩුවක් තිබුණා. භයානක සතෙක්ද දන්නෑ කියල මට හිතුණා. මම ඒ නිසා කවුරු හරි එනකම් හිටියා. සුද්දෙක් ආවා. මම එයා පස්සෙන් ගියාම එයා මට රැවුවා. සිංහල මනුස්සයෙක් ආවා. එයාගෙන් ඇහුවා මොකක්ද කියලා.”

“ඒ කිව්වේ කවුද සතා කියලා. මෙයා කියනවා මේක වැසිකිළියලු. හරි හරි ඉතින්, මට ඉංග්‍රීසි බෑනේ. මං එයාට ස්තූති කළා.”

“හා හා හා” නංගි හොඳටම හිනා වුණා.

“පුතේ, ගිහින් බුලත් කොළ ටිකක් කඩාගෙන එන්න”

“ස්තූතියි පුතේ!”

“හරි දැන් ඔන්න කතාව කියමු. දැන් මම වැසිකිළිය ළඟින් යනකොට මම දැක්කා බංකුවකුයි කැන්ටිමකුයි තිබුණා. මම ඊට පස්සේ එතනින් වඩේ ගෙඩි දෙකක් ඇරගෙන බංකුවේ ඇණ තියාගත්තා.”

"වඩේ ගෙඩියක් ගිලලා මොනවද කරන්නේ කියල කල්පනා කර කර ගියා. බලනකොට මම ගිහින් තියන්නේ ආපහු වැසිකිළිය පැත්තට. ඕං එතකොට කවුදෝ අත වනනවා. බලනකොට සූටිම සූටි ගෝරිල්ලෙක්. ඇත්ත වශයෙන්ම කිව්වොත් ගෝරිලි පැටියෙක්. පස්සේ තමයි තේරුනේ ඒකා අත වනලා තියෙන්නේ ගෝරියට ම කියලා."

"ආ මේ අලියෝත් හිටියනේ."

"ඈ අලියෝ හිටං හිටියද?" නංගි ඇහුවා. හිටං විතරක් නෙමෙයි ළමයෝ ඉඳගෙනත් හිටියා."

නංගි ලැජ්ජාවෙන් ඇඹරුණා.



“මේ අදට කතා ඇති නේද?”

”අනේ සීයේ එකම එකම එකම එකක් .... නැත්නම් මං අඬනවා.” මල්ලි අඬන්න වගේ කිව්වා.

”හරි හරි ළමයෝ, ඔන්න එහෙනම් අන්තිම කතාව. හැබැයි අඬන්න නම් ලෑස්ති වෙන්න එපා. මං අඬන ළමයින්ට කියන්නේ ‘අඬන වඳුරෝ‘ කියලා,” සීයා ආයෙත් බුලත් විටක් හපන ගමන් කිව්වා.

”ඔන්න ඉතින් මම අලි බලලා ඉවරවෙලා ඉස්සරහට යනකොට දැක්කා ලොකු තටාකයක්. ඒකෙ හිටියා දිග තොලක් තියෙන ලොකු සතෙක්.”

“මිනිස්සු කියනවා මූ ‘කිරි අලි‘ ලු! මං බැලුවා කිරි පාටක් තියා හරියකට සුදු පාටක්වත් නෑනේ මූ ළඟ. මුළු ඇඟම කළුයි. ඉතින් මං එතන හිටපු මහත්තයෙක්ගෙන් ඇහුවා ‘මහත්තයෝ, මූට කිරි අලියා කියන්නේ ඇයි? මූ කිරි දෙනවද?‘ කියලා.”

”එතකොට ඒ මහත්තයා මොකද කිව්වේ සීයේ?” මනුති නංගි කුතුහලයෙන් ඇහුවා.

”ඇයි ළමයෝ, ඒ මහත්තයා මට හොඳටම හිනාවෙලා කිව්වා ‘අයිසෙ, ඕකා කිරි අලියෙක් නෙමෙයි, ඕකා ‘කන්කිරි අලියෙක්‘ කියලා!

“මං ඉතින් කන් ඇහෙන්නේ නැති අලියෙක් වෙන්න ඇති කියලා හිතලා උෟට ටිකක් හයියෙන් කතා කළා. ඒත් මූ සද්දයක් නෑ. ඊට පස්සේ මට මතක් වුණා අපේ ගමේ ඉන්න කන් ඇහෙන්නේ නැති පොඩිත්තාව. එයාට අපි කියන්නේ...”



“අයියෝ සීයේ... ආයෙත් පීලි පැන්නා! සත්තු වත්තේ කතාව කියන්නකෝ,” මම මතක් කළා.

”හරි හරි පුතේ, ඔන්න මං ඊට පස්සේ ගියා බඩේ ලොකු මල්ලක් තියෙන සතෙක් බලන්න. උන්ට කියන්නේ ‘කෙන්ගරු’ ලු නේ. මං ඉතින් කූඩුව ළඟට වෙලා බලාගෙන ඉන්නකොට මේ සතා එකපාරටම උඩ පැන පැන මගේ දිහා බැලුවා.”

“මට හිතුණා මූ මේ මල්ලක් එල්ලගෙන කොහේ යන්නද ලෑස්ති වෙන්නේ කියලා. මං ඉතින් මගේ ඉණේ තිබ්බ ලේන්සුවයි, සල්ලි ටිකයි තියෙනවද කියලා බැලුවා. හත්තිලව්වයි! මගේ පර්ස් එක නෑ!”

”ෂා! සතා හොරකම් කරලද සීයේ?” මල්ලි ඇස් දෙකත් ලොකු කරගෙන ඇහුවා.

“නෑ ළමයෝ, මට එතකොටයි මතක් වුණේ මං ඒක ගෙදර ලාච්චුවේ දාලා ආවා කියලා! ඉතින් මට සල්ලි නැති නිසා මං අර බඩේ මල්ල තියෙන සතාගෙන් ඇහුවා ‘ණයට රුපියල් සීයෙක් දෙන්න පුළුවන්ද’ කියලා. උඹ මට රවලා අනිත් පැත්ත හැරුණා. මසුරු සතා!”



”හා හා හා!” නංගියි මල්ලියි බඩවල් අල්ලාගෙන හිනාවෙන්න පටන් ගත්තා.

”ඔහොම ඉතින් සත්තු වත්ත වටේම කරක් ගහලා මට හොඳටම මහන්සි හිතුණා.”

“සත්තු වත්තෙන් එළියට එන්න හදනකොට මං දැක්කා ලස්සන සතෙක්. මුළු ඇඟේම ඉරි ඉරි තියෙනවා. මං හිතුවේ අපේ ඉස්කෝලේ මහත්තයා ඇඳපු ඉරි තියෙන සරම වගේ එකක් මූත් ඇඳගෙන ඉන්නවා කියලා. පස්සේ තමයි තේරුණේ ඒ ‘සීබ්‍රා‘ කියලා.”

සීයා කතාව කිය කියාම එකපාරටම ලොකු ඈනුමක් ඇරියා. එයාගේ ඇස් දෙක පියවෙන්න ඔන්න මෙන්න. බලුත් විට හපලම සීයාට දැන් හොඳටම නිදිමතයි.

"ඔන්න පුතේ... කතාව ඉවරයි. දැන් ඉතින් මට පාර පේන්නෙත් නෑ වගේ. මාව ගෙදරට ඇරලවන්න කවුද එන්නේ?" සීයා ඇහුවා.

"අනේ සීයේ... තව එකම එකක් කියන්නකෝ..."

මල්ලියි නංගියි දෙන්නම සීයාගේ සරමෙන් ඇද ඇද පෙරැත්ත කළා.

සීයා ආයෙත් පාරක් හයියෙන් හිනාවෙලා, "හරි හරි ළමයෝ, ඔයාලා ඉතින් මාව මහ පාරේ නිදිකරවන්නයි ලෑස්ති වෙන්නේ."

"ඔන්න එහෙනම්, මට තව එකක් මතක් වුණා. මං අර වැසිකිළිය ළඟින් බේරිලා ඉස්සරහට යනකොට දැක්කා ලොකු කුරුල්ලෙක්. දිග බෙල්ලක් තියෙනවා, හැබැයි පියාඹන්න බෑලු! මිනිස්සු කිව්වා උෟට කියන්නේ 'පැස්බරා' කියලා."

"ඉතින් මං උෟට ලංවෙලා 'සැප දුක් කොහොමදෑ මහත්තයෝ' කියලා අහන්න හැදුවා විතරයි, මූ එකපාරටම එයාගේ ඔළුව වැලි අස්සේ ඔබාගත්තා!"

"ඇයි සීයේ උඟ ඔළුව හංගගත්තේ?" නංගි ඇස් දෙකත් ලොකු කරලා ඇහුවා.

"ඇයි ළමයෝ, මගේ මූණ දැක්කම උඟට ලැජ්ජා හිතෙන්න ඇති! නැත්නම් මං අර කලින් වඬේ කාපු සුවඳ දැනිලා උඟටත් වඬේ කන්න හිතිලා වැලි අස්සේ වඬේ හෙව්වද දන්නෙත් නෑ. ඔය වැලි කිව්වම මට මතක් වුණේ අපේ ගමේ පන්සලේ වැලි මළුව උඩදී මට වෙච්ච වැඩක්..."

"අයියෝ සීයේ... ආයෙත් පන්සල් ගියාද? කතාව සත්තු වත්තේ!" මල්ලි කෑගැහුවා.

"හරි හරි, ඔන්න සත්තු වත්තටම ආවා. ඊට පස්සේ මං දැක්කා දිග නහයක් තියෙන, ඇඟ පුරාම කටු තියෙන සතෙක්. උඟට කියන්නේ 'කටුස්සා' ද කොහේද."

"කටුස්සන්ට කටු තියෙනවද සීයේ? උන්ගේ නහය දිග නෑනේ!" මම හිනාවෙවී කිව්වා.

"නෑ නෑ, උඟ 'කටු ඉත්තෑවා'! ඉතින් මං උඟ දිහා බලන් ඉන්නකොට මගේ සරමේ පිටපොට ගැලවිලා කූඩුවේ කම්බියක පැටලුනා. මං හිතුවේ අර කටු ඉත්තෑවා මගේ සරමෙන් අදිනවා කියලා! 'බුදු අම්මෝ... ඉත්තෑවා මගේ සරම හොරකම් කරන්න හදනවෝ...' කියලා මං එතන හිටපු නෝනා කෙනෙක්ගේ ඇඟට පැනපි!"



"ඉතින් ඊට පස්සේ මොකද වුණේ?" නංගි බඩ අල්ලගෙන හිනාවෙමින් ඇහුවා.

"මොකද වෙන්නේ, ඒ නෝනා මහත්තයා කුඩෙන් මට අනින්න හැදුවා! මං ඉතින් 'තැන්කියු වෙරි මච්' කියලා එතනින් මාරු වුණා. මට ඉංග්‍රීසි බෑ කිව්වට ඔය වගේ වෙලාවට ලස්සනට වචන එනවා පුතේ," සීයා උදම් අනමින් කිව්වා.

"ඔන්න ඔහොමයි මං සත්තු වත්තේ ගියේ. දැන් ඉතින් ඇත්තටම ඇති. මගේ ඇස් දෙකට නිදිමත කූඩැල්ලෝ වගේ ඇලෙනවා," සීයා නැගිටලා යන්න හැදුවා.

"යමු සීයේ, අපි ඔයාව ගෙදරට ඇරලවන්නම්," මල්ලියි මමයි සීයගේ අත් දෙකෙන් අල්ලගත්තා. නංගි ගේ ඇතුළට දුවලා ගිහින් සීයාට බොන්න වතුර එකක් අරන් ආවා.

හිනා මාමා වතුර උගුරක් බීලා, "ඔන්න මං යනවා... හෙට උදේට ආයෙත් වැඩට එන්න ඕනේ. හැබැයි හෙට කියන්නේ සත්තු වත්ත ගැන නෙමෙයි, මං අර මුහුදු ගියපු කතාව!" කියලා හිනාවෙවී කළුවර අස්සේ අපේ අතත් අල්ලගෙන පාරට බැස්සා.

✱නිමි✱



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොත පත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසා ය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන් ම මානව දැනුම ගබඩා වී ඇති පොත පතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන් ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **හේමමාලා උපහාර** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලුදෙනාටද, දියවඩන නිලමෙතුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)